
# රනිල් - බැසිල් පාලනය යටතේ ශ්‍රී ලංකාව ඉන්දියාවේ 29 වැනි ප්‍රාන්තය බවට පත්කරන හැටි!



වර්තමන් රනිල් වික්‍රමසිංහ පාලනය යටතේ එකවර ජාත්‍යන්තර න්‍යාය පත්‍ර 6ක් ක්‍රියාත්මක වන බව ඉතා තර්කානුකූලව ඔප්පු කළ හැක. එහි අවසාන අරමුණ ශ්‍රී ලංකා රාජ්‍යය දුර්වල කර සමාජය බිඳවට්ටවා දේශපාලන සහ ආර්ථික වශයෙන් පරාධීනත්වයට නතු කිරීම බව ද පැහැදිලිව ඔප්පු කළ හැක. ඓතිහාසිකව එම න්‍යාය පත්‍ර සියල්ල ශ්‍රී ලංකාව මත පැටවීම ආරම්භ කිරීම සඳහා 77 ආණ්ඩු පෙරළියෙන් පසුව ප්‍රබල අවකාශයක් නිර්මාණය විය. එතැන් සිට විවිධ ආණ්ඩු යටතේ ක්‍රමානුකූලව වර්ධනය වෙමින් පැමිණි ගමන මේ වනවිට රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා යටතේ උච්චතම අවස්ථාවට ළඟා වෙමින් තිබෙන බව දැක ගත හැක.

එම න්‍යාය පත්‍ර අතුරින් පළමුවැන්න බෙදුම්වාදි න්‍යාය පත්‍රය වන අතර මීට පෙර ජනාධිපතිවරු 7 දෙනෙකුට නොතිබූ ධෛර්යයක් ආරූඪ කර ගනිමින් රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා සඳහන් කරන්නේ තමා 13වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කරන බවය. එනම් ව්‍යවස්ථානුකූලව පූර්ණ ෆෙඩරල් රාජ්‍යයක් නිර්මාණය කිරීම මගින් ඊළාම් රාජ්‍යයට පාර කපන බවය. ඔහුට එවැනි ධෛර්යයක් ඇති වන්නේ බාහිරින් ලැබෙන සහාය සහ මගපෙන්වීම නිසා බවට ප්‍රබල තර්කයක් මතු කළ හැක. ඊට හේතුව 69 ලක්ෂයක ජනවරමක් සහිත ගෝඨාභය රාජපක්ෂ පාලනය පෙරළා දමා ජනවරමක් නොමැති රනිල් වික්‍රමසිංහ මහතා බලයට පත් කිරීම සඳහා ප්‍රබල ඇමරිකානු සහ ඉන්දියානු මැදිහත් වීමක් සිදු වුණු බව මේ වන විට සාක්ෂි සහිතව ඔප්පු වී තිබීමය.

ඇමරිකානු දෙවන රාජ්‍ය ලේකම් වික්ටෝරියා නුලන්ඩ් විසින් රචිත පිටපතකට සහ ඉන්දියානු ආරක්ෂක උපදේශක අජිත් ඩොවාල්ගේ සංගීතයට අනුව ඇමරිකානු තානාපති ජුලී චැන්ග් විසින් අධ්‍යක්ෂණය කළ ''ගෝඨා ගෝ හෝම්'' නාට්‍යයේ අවසන් ප්‍රතිඵලය 'රනිල් කම් බැක්' බව අදාළ පිරිස් දැන් සිටි බව දැන් ඉතා පැහැදිලිය. නළුවන් සහ ප්‍රේක්ෂකයන් ලෙස භූමිකාවන් ඉටුකළ අති බහුතරයක් වූ අවංක තරුණයින් පිටකවරයේ තිබූ 'ගෝඨා ගෝ හෝම්' පමණක් දුටු බව සහ පිටපතේ අවසන් පෙළ වූ 'රනිල් කම් බැක්' සටහන නොදුටු බව ඉතා පැහැදිලිය. ඊනියා ගෝල්ෆේස් නාට්‍යය පිළිබඳව අදහස් දක්වන ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක මහතා තමා විප්ලවය යැයි සිතා ප්‍රතිවිප්ලවයට සහාය දී ඇති බව පිළිගන්නේ එම යථාර්ථයට අනුව නොවේද?.

කෙසේ වෙතත් පිටපතට අනුව අවසානයන් දෙකකින් එකක් තෝරා ගැනීමට ඉඩ තිබූ බව ද මේ වන විට හෙළිදරව් වී ඇත. එහිදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මරා දැමීමට සහ රට පුරා මහජන විරෝධතා ඇවිලවීමට හැකි වූවානම් ලිබියාවේ මෙන් ජාත්‍යන්තර මැදිහත් වීමෙන් අන්තර්කාලීන ආණ්ඩුවක් පිහිටුවීමට අවස්ථාව නිර්මාණය වේ. ඒ මගින් ඉතා කඩිනමින් සහ බලහත්කාරයෙන් ඉහත සඳහන් කළ න්‍යාය පත්‍ර ක්‍රියාත්මක කිරීමට අවකාශය ලැබිය හැක. අද ලිබියානු සහ ඉරාක ජනතාව මුහුණ දී සිටින ඛේදවාචකය දෙස බලන විට ශ්‍රී ලාංකික ජනතාවගේ නලලේ ද එම ඉරණම කොටා තිබූ බව පිළිගත හැක.

එහෙත් ඉහත සඳහන් කළ ආකාරයට ලිබියාවේ මෙන් මහා ජනතා විරෝධයක් ගොඩනැගීමට නොහැකි වීම සහ ජනාධිපති ගෝඨාභය මරා දැමීමට නොහැකි වීම නිසා පිටපතට අදාළ 'ප්ලෑන් බී' ක්‍රියාත්මක වූ බව ඉතා පැහැදිලිය. එනම් වඩාම සුදුසු දෙවන විකල්පය වන රනිල් වික්‍රමසිංහ චරිතය බලයට පත් කිරීම මගින් න්‍යාය පත්‍ර ඉදිරියට ගෙන යාම සඳහා අවකාශය නිර්මාණය කිරීමය. රනිල් වික්‍රමසිංහ මහතා වික්ටෝරියා නුලන්ඩ්ගේ පිටපතට අනුව තමාට පැවරුණු භූමිකාව පිළිබඳව දැනුවත්ව සිටි බව සහ ඒ සඳහා සූදානම් වූ බව ද දැන් ඔප්පු වී ඇත. ඔහු විසින් තම උපදේශක මහාචාර්ය ආශු මාරසිංහ සහ අමාත්‍ය හරින් ප්‍රනාන්දු යන මහත්තුරුන්ට අරගලය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය සියලුම සහයෝගය ලබා දෙන ලෙස දන්වා සිටි බව ඔවුන් දෙදෙනා ප්‍රසිද්ධියේ ම පිළිගෙන ඇත. ඊට අමතරව ඔහු නිශ්චිතව දින වකවානු බලා පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය ලබා ගන්නේ ද යම් මාර්ග සිතියමකට අනුව බවට සාධාරණව තර්ක කළ හැක.

ඒ අනුව රනිල් වික්‍රමසිංහ මහතාට ඔහු බලයට පත් කළ ඔහුගේ ස්වාමිවරුන් විසින් දැන් ප්‍රබල පීඩනයක් එල්ල කරන බවට සැකයක් නැත. විශේෂයෙන්ම පසුගිය කාලය තුළ ඔහු ඉන්දියාව සමඟ ගනුදෙනු කළ ආකාරය අනුව ඔහු අතට ලබා දී ඇති න්‍යාය පත්‍ර 6 අතුරින් දෙවැන්න වන ඉන්දියානු න්‍යාය පත්‍රයට වැඩි ප්‍රමුඛතාවක් ලබා දී ඇති බව පෙනේ. පළමු න්‍යාය පත්‍රය හෙවත් බෙදුම්වාදි න්‍යාය පත්‍රය සමඟ ද එකට ගැට ගැසී ඇති ඉන්දියානු න්‍යාය පත්‍රය පදනම් වන්නේ ''පනික්කාර් න්‍යාය'' මත බව ඓතිහාසික සත්‍යයකි. අද ඉන්දියානු රෝ ඔත්තු සේවාව විදේශ ප්‍රතිපත්තියේ මූලධර්මයක් ලෙස සලකන පනික්කාර් න්‍යාය හෙවත් මහා භාරත් න්‍යාය ඉදිරිපත් වන්නේ 1932දීය. ඊට අනුව ඉන්දියාව ආශ්‍රිත කුඩා රාජ්‍ය සියල්ල ගිවිසුම් මගින් අර්ධ යටත්විජිත ලෙස ඈ දා ගැනීම මගින් මහා භාරතය නිර්මාණය කළ යුතුය. මෙවර ඉන්දියාවේ පැවැති G20 සමුළුවේදී

ඉන්දියානු අගමැති නරේන්ද්‍ර මෝදි මහතා ඉන්දියාව හඳුන්වනු ලැබුවේ භාරතය ලෙසය.  ඊට අමතරව ඉන්දියානු පාර්ලිමේන්තුවේ ප්‍රදර්ශනය කළ භාරත සිතියමට ශ්‍රී ලංකාව ද අයත් විය.

ස්වාධීන සිකීම් රාජ්‍යය 1975 දී ඉන්දියාවේ 22 වැනි ප්‍රාන්තය ලෙස ඈඳා ගනු ලබන්නේ පනික්කාර් න්‍යායට අනුව ය. 1974 දී එවකට එරට අගමැති වූ ලෙන්ඩප් ඩෝජස් නම් වූ ඉන්දියානු ඒජන්තවරයා ශ්‍රී ලංකාවේ රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා මෙන්ම කුජීතව පරාජයට පත්විය. ඉන්පසුව පසුව ශ්‍රී ලංකාවේ ගෝල්ෆේස් අරගලය මෙන් ඉන්දියාවේ මැදිහත්වීම මත අදාළ මැතිවරණය දූෂිත බවට රජුට විරුද්ධව මහජන උද්ඝෝෂණ ආරම්භ කෙරිණි. ඊට යටත් වූ රජුට නව මැතිවරණයක් කැඳවීම ට සිදු විය. එහිදී බරපතළ ලෙස කුජීතව පරාජයට පත්ව සිටි අගමැතිට ඉන්දියානු මැදිහත්වීම යටතේ ප්‍රබල ජයග්‍රහණයක් හිමිකර ගැනීමට හැකි විය. අවසානයේදී වසරක් තුළ ඉන්දියාව විසින් ඉදිරිපත් කළ සියලු ගිවිසුම් වලට එකඟ වීම මගින් ඉන්දියාවේ 22 ප්‍රාන්තයේ ආණ්ඩුකාරධුරය හිමිකර ගැනීමට ලෙන්ඩප් ඩෝජස්ට හැකි විය.

එම තත්වය ශ්‍රී ලංකාවට අදාළව ගත් විට ගෝඨාභය රාජපක්ෂ පාලනය තුළ බැසිල් රාජපක්ෂ යොදාගනිමින් ඉන්දියානු න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කළ නො හැකි ද යන ප්‍රශ්නය මතු කළ හැක. බැසිල් රාජපක්ෂ මහතා 2021 නොවැම්බර් මාසයේදී ඉන්දියාවට ගොස් ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි සංකීර්ණය ඉන්දියාවට ලබාදීම, අදානි සමාගමට උතුරු සහ නැගෙනහිර පළාත්වල බලශක්ති ව්‍යාපෘතිවල ඒකාධිකාරිය ලබාදීම, තවත් ඉන්දියානු සමාගමකට කන්තලේ සීනි කර්මාන්ත ශාලාවේ අක්කර 20,000 ක ඉඩම් මෙන්ම ආනයනික සීනි සේදීම මුවාවෙන් අග්නිදිග ආසියාවේ විශාලතම මධ්‍යසාර නිෂ්පාදනාගාරය පිහිටුවීම සඳහා අවසර ලබාදීම, කොළඹ වරායේ බටහිර ජැටිය අදානි  සමාගමට ලබාදීමට අදාළ කටයුතු අවසන් කිරීම හා ශ්‍රී ලංකාවේ සමුද්‍ර කලාපයේ ආවේක්ෂණය කිරීමේ ක්‍රියාවලිය ඉන්දියානු නාවික හමුදාවේ අධීක්ෂණයට යටත් කිරීම ආදී බරපතල උපායමාර්ගික ක්‍රියාවලියකට එකඟතාව ලබා දුන් බව සත්‍යයකි.

නමුත් කරුණු දෙකක් මත ගෝඨාභය පාලනය යටතේ ඉන්දියානු අරමුණු කෙටි කාලීනව සාක්ෂාත් කර ගැනීම පහසු නොවන බව රෝ සංවිධානය විසින් පිළිගැනීම පුදුමයට කරුණක් නොවේ. පළමුවැන්න බැසිල් රාජපක්ෂ කෙතරම් උත්සාහ කළ ද ගෝඨාභය පාලනය බලයට පත් කළ සිංහල බෞද්ධ බලවේගය බිඳවැට්ටවීමෙන් තොරව ඔවුනට අවශ්‍ය අවසන් ප්‍රතිඵලය අත්පත් කරගත නොහැකි බව ඉතා පැහැදිලිය. ඒ අනුව ගෝඨාභය පලවාහැරීම සහ බහුතර සිංහල බෞද්ධ බලවේගයේ පිටකොන්ද බිඳීම එකවර සිදු වූ බව පිළිගැනීමට සිදුවේ. දෙවැන්න උත්සන්න වන ආර්ථික අර්බුදය තුළ එය තවදුරටත් උත්සන්න කිරීම සහ ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඉන්දියාවේ අනුකම්පාවට යටත් කිරීම ය. ඒ සඳහා වඩා සුදුසු වන්නේ ආර්ථිකය තවදුරටත් වැට්ටවීම සහ උදව් කිරීම මගින් ගැලවුම්කාරයා බවට පත්වීම සහ අවසානයේදී 'ගෝඨා ගෝ හෝම් - රනිල් කම් බැක්'  උපායමාර්ගික ප්‍රවේශය බව ඉතා පැහැදිලිය.

කෙසේ වෙතත් සර්ධාර් පනික්කාර් න්‍යාය පත්‍රයේ දිග පළල වඩා පුළුල්ව සලකා බැලීමට පෙර සෙසු න්‍යාය පත්‍ර පිළිබඳව මූලික හැඳින්වීමක් අවශ්‍ය බවට විවාදයක් නැත. ඒ අනුව රනිල් වික්‍රමසිංහ මහතා තදින් අල්ලාගෙන සිටින තුන්වැනි න්‍යාය පත්‍රය ඇමරිකානු හෙවත් ඉන්දු පැසිෆික් භූ දේශපාලන උවමනාවන්ට අදාළ න්‍යාය පත්‍රය බව පිළිගැනීමට සිදුවේ. යම් අඳබාල දේශපාලන නායකයින් ඉන්දියානු සහ ඇමෙරිකානු න්‍යාය පත්‍ර අතර ප්‍රතිවිරෝධයක් තිබෙන බවට කල්පනා කරන බව පෙනේ. එහෙත් ප්‍රායෝගිකව එසේ නොවන බව මේ වනවිට ආසියාවේ NATO හෙවත් QUAD සංවිධානය තුළ ඉන්දියාව සහ ඇමෙරිකාව විසින් ඇතිකර ගෙන තිබෙන එකඟතාවන් තුළින් පැහැදිලි වේ. ඉන්දියාව සහ ඇමරිකාව අතර යුද සහ ආරක්ෂක ගිවිසුම් හතරක් අත්සන් කර ඇත. (BECA, GSOMIA, LEMOA,COMCASA) එම ගිවිසුම මගින් ඒකාබද්ධ පුහුණුවීම් සහ මෙහෙයුම් සිදුකිරීම, ඔත්තු සේවා ඒකාබද්ධ කිරීම, තොරතුරු හුවමාරු කරගැනීම සහ යුද සැපයුම් ආදී ක්ෂේත්‍ර ආවරණය වේ.

ඊට අමතරව ඇමරිකාව සහ ශ්‍රී ලංකාව අතර අත්සන් කළ ඇමරිකානු හමුදාවලට ශ්‍රී ලංකාවේ භූමිය, මුහුද වරායවල් ආදිය යොදා ගැනීමට ඉඩ සැලසීම මුල්කරගත් ACSA සහ SOFA ගිවිසුම පිළිබඳව ඉන්දියාව කිසිදු විරෝධයක් දක්වා නැත. එසේම දැනට අත්සන් කිරීමට බලකෙරෙන MCC ගිවිසුම පිළිබඳව හෝ මෑතකාලීනව CIA සහ NATO ප්‍රධානීන් ශ්‍රී ලංකාවට පැමිණ ඔත්තු සේවා ඒකාබද්ධ කිරීම සහ තොරතුරු පද්ධති ඒකාබද්ධ කිරීමට අදාළව ඇති කර ගත් එකඟතාවයන් පිළිබඳව ද ඉන්දියාව කිසිදු විරෝධයක් දක්වා නැත. ඒ අනුව ඉන්දු පැසිෆික් න්‍යාය පත්‍රයට අදාළව ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාට ලබාදී ඇති ඇමරිකානු න්‍යාය පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා ඉතිරිව ඇත්තේ SOFA ගිවිසුම ට අදාළව මේ වන විට ඉදිරිපත් වී ඇති 'ඇමුණුම බී' නැමැති ලේඛනයට එකඟතාව පළ කිරීම සහ MCC ගිවිසුම අත්සන් කිරීම ය. එම කටයුතු බොහෝ විට සිදු වන්නේ ඉදිරි ජනාධිපතිවරණය දිනා ගැනීමෙන් පසුව බවට උපකල්පනය කළ හැක.

ඇමරිකානු හෙවත් ඉන්දු පැසිෆික් න්‍යාය පත්‍රයට අදාළ ACSA, SOFA, සහ MCC ගිවිසුම් ත්‍රිත්වය ක්‍රියාත්මක වන විට ශ්‍රී ලංකාවේ සමස්ත භූමියම ඉන්දු ඇමරිකානු ඒකාබද්ධ යුද උපායමාර්ගයට අනුකූලව යොදා ගැනීමේ හැකියාව ලැබේ. ඒ අනුව ඇමරිකානු හමුදාවේ සොල්දාදුවෙකුට නිලධාරියෙකුට හෝ එම හමුදාවලට සේවා සපයන කොන්ත්‍රාත්කරුවන්ට ගුවනින් හෝ මුහුදෙන් රට තුළට ඇතුළු වීමට හැකියාව ලැබේ. ඒ සඳහා පූර්ව අවසරයක් ලබාගැනීම අවශ්‍ය නොවේ. ඊට අමතරව ඔවුන්ට රට තුළ ගුවනින් මුහුදෙන් හෝ මහා මාර්ග භාවිතා කරමින් ඕනෑම ප්‍රදේශයකට ගමන් කළ හැකි අතර ඕනෑම ස්ථානයක කඳවුරු බැඳිය හැක. එහිදී ඔවුන්ට නිල ඇඳුම් ඇතිව හෝ නැතිව මෙන්ම ආයුධ සන්නද්ධව හෝ එසේ නොමැතිව රට තුළ ගමන් කළ හැකි අතර කිසිදු අවස්ථාවක ඔවුන්ගේ ගමන්මලු හෝ  වාහන පරීක්ෂා කළ නොහැක. අමෙරිකානු හමුදාවලට අවශ්‍ය පහසුකම් සඳහා සැපයුම් මධ්‍යස්ථානය ත්‍රිකුණාමලය ආශ්‍රිතව පිහිටුවීම සහ සැපයුම් සඳහා අවශ්‍ය භූමිය ලබා ගැනීම සඳහා MCC ගිවිසුම මගින් අවකාශය නිර්මාණය වේ.

දැනටමත් සිංගප්පූරුවේ SURBANA JURONG නැමැති උපදේශක සමාගම විසින් සකස් කළ සැලසුම් අනුව ත්‍රිකුණාමලයේ වරාය ආශ්‍රිතව ඊට අවශ්‍ය නව කර්මාන්ත සහ සෙසු පහසුකම් ජාලය පිහිටුවනු ඇත. ඒ සඳහා අවසර ලබා දී ඇත්තේ

ඉන්දියානු ඇමරිකානු සහ ජපාන සමාගම් වලට පමණි. පසුගිය දිනවල ශ්‍රී ලංකාවට පැමිණි වික්ටෝරියා නුලන්ඩ් ඉන්දියාවේ දී එරට විදේශ අමාත්‍ය ජයශංකර් මහතා සමඟ සිදු කළ සාකච්ඡා වලදී ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමලය ආශ්‍රිතව ඉන්දු ඇමරිකානු ඒකාබද්ධ යුද සැපයුම් මධ්‍යස්ථානයක් පිහිටු විය යුතු බවට එකඟ වූ බව වාර්තා විය. මේ සියල්ල මගින් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවට අදාල ඉන්දියානු සහ ඇමරිකානු න්‍යාය පත්‍ර අතර කිසිදු පරස්පරතාවක් නොමැති බව නොවේද?.

රනිල් වික්‍රමසිංහ මහතා දැනටමත් ඉතා නිර්භීත සහ ප්‍රබල ලෙස ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇති හතරවැනි න්‍යාය පත්‍රය IMF න්‍යාය පත්‍රය බව දැන් ඉතා පැහැදිලිය. එය මිල්ටන් ෆ්‍රීඩ්මන්ගේ 'වෙළඳපොළ විසින් ආර්ථිකය පාලනය කළ යුතුය' යන න්‍යාය මත පදනම් වේ. ඒ අනුව පුද්ගලික අංශය ආර්ථිකයේ මහා භූමිකාව ඉටු කළ යුතු අතර රජය සතු දේපළ සහ වගකීම් පුද්ගලීකරණය කිරීම මගින් රාජ්‍යය කුඩා කරනු ලැබේ. බාධාවකින් තොරව නිදහස් වෙළඳාම ප්‍රචලිත කිරීම තුළ ගෝලීය මහා සමාගම් විසින් ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථිකය අත්පත් කර ගැනීමට එමගින් අවකාශය සැලසේ. දැනටමත් පාඩු ලබන රාජ්‍ය ආයතන විකුණා දැමීමේ මුවාවෙන් ලාභ ලබන ආයතන පවා විකුණා දැමීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. ඊට රජයට අයත් ගොවිපළවල් සහ සෙසු ඉඩම් පවා විකුණා දැමීම අයත් වේ.

සමස්තයක් ලෙස රටේ ආර්ථිකය පරාධීනත්වයට පත් කිරීම පස්වැනි න්‍යාය පත්‍රය ලෙස සැලකිය හැක. මෙම ක්‍රියාවලිය 1977 දී උත්කර්ෂවත් ලෙස ආරම්භ වූ අතර මේ වන විට ආර්ථික අර්බුදය තුළ අවසානය කරා ළඟා වෙමින් ඇත. ඒ තුළ දේශීය නිෂ්පාදන පද්ධතිය බිඳවැටෙන අතර බලශක්ති සුරක්ෂිතතාවය සහ ආහාර සුරක්ෂිතතාව අනතුරට ලක්වේ. රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව විසින් හඳුන්වා දෙන බදු ප්‍රතිපත්තිය සහ බලශක්ති ප්‍රතිපත්තිය තුළ දේශීය නිෂ්පාදකයා තවදුරටත් දුෂ්කරතාවලට ගොදුරු වෙමින් පවතින අතර මේ වන විට කර්මාන්ත 2000කට අධික ප්‍රමාණයක් වැසී ගොස් ඇති බව වාර්තා වේ. ආර්ථික පරාධීනත්වයට පත් කිරීම සහ IMF න්‍යාය පත්‍රය මෙන්ම ඉන්දු ඇමරිකානු න්‍යාය පත්‍ර ද එකට බැඳී ඇත. රුපියල අවප්‍රමාණය වී ඇති තත්වය තුළ බිඳවැටෙන දේශීය සමාගම් කුණුකොල්ලයට අත්පත් කර ගැනීමේ අවකාශය ඉන්දියානු සමාගම් වලට ලැබෙනු ඇත.

යටත්විජිත පාලන සමයේ සිට ක්‍රියාත්මක වූ සහ රනිල් වික්‍රමසිංහ පාලනය තුළ තුළ ශීඝ්‍රගාමීව ඉදිරියට යන හයවැනි න්‍යාය පත්‍රය සමාජය බිඳවැට්ටවීමේ ක්‍රියාවලිය ලෙස හඳුනාගත හැක. යටත්විජිත පාලනයට අදාළ උපාය මාර්ගික ප්‍රවේශය වූයේ රාජ්‍යය අත්පත් කර ගැනීම මගින් සමාජයීය බිඳවැට්ටවීම ය. නමුත් නූතන ක්‍රියාවලිය තුළ සමාජය බිඳ වැට්ටවීම තුළ රාජ්‍යය දුර්වල කිරීම සහ යටත් කිරීම යන උපාය මාර්ගය යොදා ගන්නා බව පැහැදිලිව දැක ගත හැක. සමාජය බිඳ වැට්ටවීම සඳහා එදා මෙන්ම අද ද යොදාගනු ලබන්නේ ප්‍රබල සමාජ සංස්ථා බිදවැට්ටවීමය. ශ්‍රී ලංකාවේ එවැනි සමාජ සංස්ථා ත්‍රිත්වයක් හඳුනාගත හැක. පළමුවැන්න සංඝ සමාජය වන අතර දෙවැන්න පවුල වන අතර තුන්වැන්න පුද්ගලයා ලෙස වෙන්කර දැක්විය හැක. අප වැනි සභ්‍යත්ව රාජ්‍යයක පුද්ගලයා ද සමාජ සංස්ථාවක් බවට පත් වන්නේ සමාජයේ වටිනාකම් පද්ධතිය පවත්වාගෙන යෑම සඳහා පුද්ගලයා විසින් සමාජය තුළ ප්‍රබල භූමිකාවක් ඉටු කිරීම නිසාය. සමාජය ප්‍රචණ්ඩකරණය කිරීම මගින් පුද්ගලයා බිඳවැට්ටවීම සහ පුද්ගලයා ප්‍රචණ්ඩකරණය කිරීම මගින් සමාජය බිදවැට්ටවීමේ ක්‍රියාවලිය පවත්වාගෙන යාම සඳහා විවිධ සටන්කාමී දේශපාලන පක්ෂ යොදා ගන්නා බවට සාක්ෂි ඉදිරිපත් වේ.

ඒ අතර ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ නාමයෙන් සහ සමරිසියන්ට සාධාරණය ඉටු කිරීමේ නාමයෙන් මෙන්ම සමස්තයක් ලෙස පුද්ගලයා ප්‍රචණ්ඩකරණය කිරීම මගින් අවසානයේදී පවුල නමැති සංස්ථාව බිඳවැට්ටවීම අරමුණු කෙරෙන බව ඉතා පැහැදිලිය. ඊට අමතරව සංඝ සමාජය බිඳවැට්ටවීම සඳහා ඇතුළතින් සහ පිටතින් දියත් වී ඇති ක්‍රියාවලිය මේ වන විට උච්චතම අවස්ථාවකට ළඟා වී ඇති බව ඉතා පැහැදිලිව දැකගත හැක. රජු සහ ජනතාව අතර බල තුලනය පවත්වා ගෙන යාම සඳහා සංඝ සමාජය විසින් ඓතිහාසිකව ඉටු කළ භූමිකාව සැලකිල්ලට ගැනීමේදී සංඝ සමාජයේ බලය බිඳවැට්ටවීම මගින් සමාජය බිඳවැට්ටවීම පමණක් නොව රාජ්‍යය අයාලේ යාමට ඉඩ සලස්වා දුර්වල කිරීම ද එකවිට සිදු වන බව ඉතා පැහැදිලිය. මෙම න්‍යාය පත්‍ර සියල්ල ක්‍රියාත්මක කිරීමට අදාළ ව්‍යුහාත්මක වෙනස්කම් සඳහා රනිල් වික්‍රමසිංහ මහතා විසින් පදනම සකස් කරනු ලබන්නේ 2003දී ඉදිරිපත් කළ යලි පුබුදමු ශ්‍රී ලංකා වැඩසටහන මගිනි. ඒ තුළ පනත් 32ක් සංශෝධනය කිරීමට සහ නව පනත් ලෙස හඳුන්වාදීමට යෝජනා කරනු ලැබීය. නමුත් මහජන විරෝධය නිසා එතුමාට එම න්‍යායපත්‍රය අකුලා ගැනීමට සිදුවූ අතර අගමැතිකමද අහිමි විය.

එක විට ක්‍රියාත්මක වන මෙම න්‍යාය පත්‍ර 6 අතුරින් මේ වන විට ඉන්දියානු න්‍යාය පත්‍රයට අදාළ ක්‍රියාවලිය ශීඝ්‍රගාමීව ඉදිරියට ගමන් කරන බව දැක ගත හැක. ඉන්දියාවේ හිටපු තානාපති සහ ඇමරිකාවේ නිල නොවන තානාපති මිලින්ද මොරගොඩ මහතාට අනුව සහ ඉන්දියාවේ රෝ ඔත්තු සංවිධානයට බුද්ධිමය මඟපෙන්වීම සලසන ජවහල්ලාල් නේරු විශ්වවිද්‍යාලයේ පර්යේෂකයින්ට අනුව ශ්‍රී ලංකාවට ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ඇත්තේ එකම විකල්පයකි. එනම් ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඉන්දියානු ආර්ථිකය සමඟ ඒකාබද්ධ කිරීමය. ඒ සඳහා ආර්ථික ඒකාබද්ධකරණයට අදාළ මූලික උපාංග හයක් යොදාගන්නා බව පසුගිය ජූලි 22 වැනි දා රනිල් වික්‍රමසිංහ මහතා සහ නරේන්ද්‍ර මෝදි මහතා විසින් සිදු කළ ඒකාබද්ධ ප්‍රකාශය මගින් ඉතා හොඳින් පැහැදිලි වේ. එම උපාංග 6 යොදාගනු ලබන්නේ මේ වන විට අත්පත් කරගෙන තිබෙන උපායමාර්ගික වත්කම් සහ ක්‍රියාවලීන්ගේ දිගුවක් ලෙස සහ අවසාන අරමුණට සාපේක්ෂව කූඨප්‍රාප්තිය ලෙස බව ද ඉතා පැහැදිලිය. එම අත්පත්කර ගැනීම් වලට අදාලව දීර්ඝ ලැයිස්තුවක් හඳුනා ගත හැක.

පළමුවැන්න ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සහ කොළඹ වරායේ බටහිර ජැටිය අත්පත් කර ගැනීම ය. ඒ අතර කොළඹ වරාය නැගෙනහිර ජැටිය ලබාගැනීම සහ ත්‍රිකුණාමල වරාය නව ජැටියක් ලබාගැනීම සඳහා බලපෑම් එල්ල කරමින් ඇත. දෙවැන්න එහිම දිගුවක් ලෙස උතුරු සහ නැගෙනහිර පළාත්වල උපාය මාර්ගික වශයෙන් වැදගත් භූමිය සහ ව්‍යාපාර අත්පත් අත්පත් කර ගැනීම ය. උදාහරණයක් ලෙස පුනරීන්, සාම්පූර් සහ යාපනය ආශ්‍රිත දූපත්වල විදුලිබල ව්‍යාපෘති ලබා ගැනීම, ත්‍රිකුණාමල වරාය ආශ්‍රිත ආයෝජන කලාපයේ ආයෝජන සඳහා ප්‍රමුඛතාව ලබා ගැනීම, කන්තලේ සීනි කර්මාන්ත ශාලාවේ අක්කර 20,000ක භූමිය සහ මහා පරිමාණ මත්පැන් නිෂ්පාදන අයිතිය මෙන්ම සීනි වෙළෙඳපොළ අත්පත් කර

ගැනීමට ඉඩ ලබා ගැනීම, පශු සම්පත් මණ්ඩලයේ ගොවිපළ සහ මිල්කෝ ආයතනය අත්පත් කර ගැනීම මගින් දේශීය කිරි ආර්ථිකය අත්පත් කර ගැනීම, කාවේරි සහ මන්නාරම මුහුදු ආශ්‍රිත ඛනිජ තෙල් ගවේෂණ අයිතිය ලබාගැනීම, පලාලි සහ මඩකලපු ගුවන් තොටුපළවල් සිවිල් ගුවන් තොටුපොළවල් බවට පත්කර ඉන්දියානු ඒකාධිකාරිය යටතට ගැනීම, කන්කසන්තුරේ වරාය ආශ්‍රිත මගී සහ භාණ්ඩ ප්‍රවාහන ඒකාධිකාරිය අත්පත් කර ගැනීම, ශ්‍රී ලංකා ගුවන් සමාගම සහ මත්තල ගුවන්තොටුපළ අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම ආදිය එම ලයිස්තුවට අයත්වේ. ඊට අමතරව හැඳුනුම්පත් ව්‍යාපෘතිය මගින් රටේ දත්ත පද්ධතියට ඇතුළු වීමේ අවකාශය ලබා ගැනීමට මෙන්ම ශ්‍රී ලංකාවේ සාගර කලාපය ආශ්‍රිත ආවේක්ෂණ සහ ඔත්තු සේවා ක්‍රියාවලිය මෙහෙයවීමේ අයිතිය ලබාගැනීම ආදී යුදමය උපායමාර්ගික වාසි රාශියක් ද ඉන්දියාව විසින් ලබාගෙන ඇත.

ඒ සියල්ලේ කූඨප්‍රාප්තිය වන්නේ ඉහත සඳහන් කළ ආකාරයට 2023 ජුලි 22 ඒකාබද්ධ ප්‍රකාශයයි. ඒ මගින් ආර්ථික ඒකාබද්ධකරණයේ උපාංග 6ක් සඳහා පහසුකම් සැලසේ. පළමුවැන්න මුල්‍ය ඒකකය ඒකාබද්ධ කිරීමය. ඊට පහසුකම් සැලසෙන ආකාරයට දැනටමත් මහ බැංකු පනත සංශෝධනය කර ඇත. දෙවැන්න රේගු ඒකාබද්ධකරණය සහ තෙවැන්න බදු ප්‍රතිපත්තියේ එකාබද්ධකරණයයි. එට්කා (ETCA) ගිවිසුම මගින් ඒ සඳහා අවස්ථාව සැලසේ. එවිට ඉන්දියානු භාණ්ඩ සහ සේවා මෙන්ම පුද්ගලයින්ටද ශ්‍රී ලංකාවට නිදහසේ ඇතුළු වීමට අවකාශය ලැබේ. එවිට ඉන්දියානුවෙකුට ශ්‍රී ලාංකිකයෙකු භුක්තිවිඳින අයිතිවාසිකම් ශ්‍රී ලංකාව තුළ දී ලැබෙනු ඇත. හතරවැන්න බලශක්ති පද්ධතිය ඒකාබද්ධකරණය වන අතර පස්වැන්න වරාය සහ ගුවන් තොටුපළ ඒකාබද්ධකරණය හෙවත් සැපයුම් පද්ධතිය ඒකාබද්ධකරණයයි. සයවැන්න මහා මාර්ග සහ දුම්රිය මාර්ග මඟින් භූගෝලීයව ඒකාබද්ධ කිරීම ය.

ඒ මගින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය සමස්තයක් ලෙස ඉන්දියාවේ ආර්ථිකය සමග ඒකාබද්ධ කෙරෙන බව ඉතා පැහැදිලිය. ඒ සියලු අත්පත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව මුහුණ දෙමින් සිටින ආර්ථික අර්බුදය යොදාගන්නා බව පමණක් නොව එම අර්බුදය උත්සන්න කිරීමට අදාළ තීන්දු ගැනීම සඳහා ඉන්දියාව විසින් බලපෑම් කළ බවට තොරතුරු හෙළිදරව් වී ඇත. උදාහරණ ලෙස රුපියල පා කිරීම මගින් එහි අගය ඉතා පහළ මට්ටමකට වැටීමට සැලැස්වීම සහ බංකොලොත්භාවය ප්‍රකාශයට පත් කිරීම මගින් ණය සහ ආධාර සඳහා ඉන්දියාව මත පමණක් යැපීමට සිදු වන තත්වයක් නිර්මාණය කිරීම ආදිය පෙන්වා දිය හැක.

ඒ ආකාරයට අර්බුදය නිර්මාණය කරමින් සහ එය යොදාගනිමින් ඉන්දියාව විසින් දියත් කළ මෙහෙයුම සඳහා ඉන්දියාව විසින් ආයෝජනය කරනු ලබන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 5000කට අඩු ප්‍රමාණයකි. ඒ සෑම ඩොලරයක්ම ඉන්දියාට ආපසු ලැබෙන බව සහ ඒ මගින් ලාභයක්ද උපයන බව රහසක් නොවේ. ඒ අනුව අර්බුදය ආරම්භයේදී ඩොලර් මිලියන 400ක හුවමාරු පහසුකමක් ලබාදෙමින් 2020 ජුලි මාසයේ දී ආරම්භ වූ ක්‍රියාවලිය තුළ 2021 නොවැම්බර් මාසයේ දී අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සහ ඉන්ධන ඉන්දියාවෙන් මිලදී ගැනීම සඳහා ඩොලර් මිලියන 1500ක ණයක් දක්වා වර්ධනය විය. ඉන්පසුව 2022 ජනවාරි මාසයේදී ඩොලර් මිලියන 500ක ණය පහසුකම සහ මිලියන 400ක හුවමාරු පහසුකම් ලබා දුන් අතර ඉන්ධන මිළ දී ගැනීම සඳහා තවත් ඩොලර් මිලියන 500ක ණය පහසුකම් ලබා දුනි. ඉන්පසුව 2022 පෙබරවාරි මාසයේදී සහ මාර්තු මාසයේදී ඉන්ධන මිල දී ගැනීම සඳහා තවත් ඩොලර් මිලියන 500 බැගින් ලබා දුනි. එසේ රුසියාවෙන් ඉතා අඩු මිලට ලබා ගන්නා ඛනිජ තෙල් ශ්‍රී ලංකාවට විකුණා ඉන්දියාව 50% ක ලාභයක් උපයා ගත් බවද රහසක් නොවේ. එසේ හුවමාරු හෝ ණය ලබාදුන් සෑම අවස්ථාවකම ඊට හිලව්වට ඉහත සඳහන් කළ අත්පත්කර ගැනීම්වලට අදාළව අවබෝධතා ගිවිසුම් 6ක් අත්සන් කරවා ගත් අතර ඊට අදාළව එකඟතාවන් 6ක් ද ඇතිකර ගන්නා ලදී.

ඒ සියල්ලෙහි ප්‍රතිඵලයක් ලෙස ණය සඳහා ඉන්දියාව මත යැපීමට සිදුවීම සහ ඉහත සඳහන් කළ ඒකාබද්ධකරණ සියල්ල සම්පූර්ණ වූ විට සිකීම් රාජ්‍යය මෙන් ශ්‍රී ලංකාව ඉන්දියාවේ ප්‍රාන්තයක් බවට පත්වීම යනු ඉතා කෙටි කාලයක් පිළිබඳ ප්‍රශ්නයක් පමණි. බොහෝ විට ඉදිරි ජනාධිපතිවරණය රනිල් වික්‍රමසිංහ මහතා විසින් දිනා ගතහොත් ශ්‍රී ලංකාව ඉන්දියාවේ 29 වැනි ප්‍රාන්තය බවට පත්වීම සහ ලෙන්ඩප් ජෝජස් මෙන් රනිල් වික්‍රමසිංහ මහතාට ඉන්දියාවේ ආණ්ඩුකාරයා බවට පත්වීමට වසරක කාලයක් සෑහෙනු ඇත. නමුත් එම ක්‍රියාවලිය 29වැනි ප්‍රාන්තයෙන් නොනවතින බව සහ ඊළම හෙවත් 30 වැනි ප්‍රාන්තය නිර්මාණය කිරීම දක්වා ඉදිරියට ගමන් කරන බවට කිසිදු සැකයක් නැත. ඊට හේතුව ඉතිහාසයේ 17 වතාවක් ආක්‍රමණය කළ ද ඉන්දියාවේ ප්‍රාන්තයක් බවට පත් කරගත නොහැකි වීමය. එම නිසා ශ්‍රී ලංකාව දිර්ඝකාලීනව යටත් කර තබා ගැනීම සඳහා බෙදුම්වාදී න්‍යාය පත්‍රය අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසියක් බවට පත්වේ. එනම් රටවල් දෙකක් බිහි කර මරා ගැනීමට සැලැස්වීම මගින් රාජ්‍යය සහ සමාජය දුර්වල කිරීම යනු සමස්ත ක්‍රියාවලියට අදාළ උපායමාර්ගික පූර්ව කොන්දේසියකි.

පවතින ආර්ථික අර්බුදය තුළ ඉන්දියානු රජය විසින් 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන්ම බලාත්මක කිරීම සහ පළාත් සභා මැතිවරණය පැවැත්වීම සඳහා ප්‍රබල බලපෑමක් එල්ලකරනු ලබන්නේ එම පූර්ව කොන්දේසියට අනුවය. ඒ අනුව බොහෝවිට සුමන්තිරන් මහතාට හෝ විග්නේෂ්වරන් මහතාට 30 වැනි ප්‍රාන්තයේ ආණ්ඩුකාර ධුරය හිමිවිය හැක. ඊට අමතරව ඉන්දු - ඇමෙරිකානු පොදු න්‍යාය පත්‍රය හෙවත් ඉන්දු - පැසිපික් යුද උපායමාර්ගික සැලසුමට අනුව ඊළාම් රාජ්‍යය ආසියාවේ ඊශ්‍රායලය බවට පත්කෙරෙන බවට කිසිදු සැකයක් නැත. එවිට අනාගතයේදී ශ්‍රී ලාංකිකයින් ලෙස හඳුන්වන ජනතාවට, විශේෂයෙන්ම අතිබහුතරයක් වන බෞද්ධ ජනතාවට අද ගසා තීරයේ ජනතාවට අත්වන ඉරණම අත්විය හැකි බව ද ලියා තැබිය යුතුය. ඉන්දියානු ව්‍යාප්තවාදයට අදාළ සාකච්ඡාව තුළ ඒ පිළිබඳව මුලින්ම දේශපාලන විග්‍රහයක් ඉදිරිපත් කරනු ලබන්නේ රෝහණ විජේවීරයන් විසින්ය.

දේශහිතෛෂී ජාතික ව්‍යාපාරය

2023-11-20